060

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2015/2016

**(ප්‍රථම සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2017 දෙසැම්බර්)**

## BLE 303- ශ්‍රම ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර විහාම් ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. i. වැඩ කිරීම හා විවේකය පිළිබඳ මූලික ආකෘතියේ (work leisure model) ප්‍රධාන උපකල්පන මොනවාද?

(ලකුණු 04)

ii. "ශ්‍රම වෙළඳපලට කොපමණ පැය ප්‍රමාණයක් සපයන්නේද යන්න පුද්ගලික තීරණයකි (individual decision)". මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. පහත අවස්ථාවලදී වැටුප් වැඩිවීමක් ශ්‍රම සැපයුමට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(අ) ආදේශන ප්‍රතිවිපාකය ආදායම් ප්‍රතිවිපාකයට වඩා විශාල වීම.

(ආ) ආදේශන ප්‍රතිවිපාකය ආදායම් ප්‍රතිවිපාකයට වඩා කුඩාවීම

(ඇ) ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක එක සමාන වීම

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

02. i. "පසුගිය දශකයේදී ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ ආයෝජන විශාල ලෙස ඉහල ගොස් ඇත." මෙම තත්ත්වය ශ්‍රම වෙළඳපල මත ඇති කරන බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ශ්‍රම ඉල්ලුම හා ශ්‍රමයේ ආන්තික අයභාර නිෂ්පාදනය (MRP) අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. ශ්‍රම ඉල්ලුම් නම්‍යතා සංගුණකය යන්නෙන් කුමක් අදහස් වේද? එම සංකල්පයේ ඇති ප්‍රායෝගික වැදගත්කම කුමක්ද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. i. ඇතැම් ආයතනවල ශ්‍රමිකයන් සඳහා වැටුපට අමතරව විකල්ප ගෙවීම් සිදු කරනු ලබයි. (උදාහරණ කෑලි ගණනට ගෙවීම්, කොමිස් ගෙවීම) මෙවැනි විකල්ප ගෙවීම් කිරීම සඳහා ආයතන වැඩි නැඹුරුවක් දක්වන්නේ මන්ද?

(ලකුණු 05)

ii. කාර්යක්ෂම වැටුප් යන්නෙන් කුමක් අදහස්වේද?

(ලකුණු 05)

iii. ආයතන කාර්යක්ෂම වැටුප් ගෙවීමට තීරණය කරන්නේ කුමන අවස්ථා වලදී ද?

(ලකුණු 05)

iv. මූර්ත වැටුප හා නාමික වැටුප අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04. i. "ශ්‍රම වෙළඳපොල පූර්ණ තරඟකාරී නම් වැටුප් වෙනස්කම් (wage differentials) දැකිය නොහැක" මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල පුහුණු කම්කරුවන් සඳහා තීරණය වී ඇති වැටුප් ග්‍රාමීය ප්‍රදේශවල තීරණය වී ඇති වැටුපට සාපේක්ෂව වැඩිය. මෙවැනි තත්ත්වයක් සමතුලිත තත්ත්වයක් ලෙස පවතින්නේ ඇයි ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. i. ශ්‍රම වෙළඳපල තුළ වෙනස්කම් කර සැලකීම් වල විවිධ ස්වරූපයන් (Types of labour market discrimination) මොනවාද?

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ ඇතැම් රැකියා වල කාන්තාවන් පමණක් සේවා නියුක්ත වී ඇති අතර ඇතැම් රැකියාවල බහුතරය පුරුෂයන් වේ. මෙවැනි තත්ත්වයක් ඇතිවීමට බලපා ඇති හේතූන් මොනවාද?

(ලකුණු 05)

iii. ජනප්‍රිය පාසල්වල අධ්‍යාපනය ලැබූ ශ්‍රමිකයින්ට ශ්‍රම වෙළඳපොල තුළ වැඩි අවස්ථාවක් පවතී. මෙම තත්ත්වය ශ්‍රම වෙළඳපොල තුළ වෙනස්කම්කර සැලකීමක් (Discrimination) ලෙස ඔබ දකින්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

06. i. වැටුප් ඉහල නංවා ගැනීම සඳහා වෘත්තීය සමිතිවලට අනුගමනය කළ හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති වැටුප් ඉහල නංවා ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ගයන් විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

07. පහත සංකල්ප පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ඌණ සේවා නියුක්තිය හා අධි සේවා නියුක්තිය.

ii. ශ්‍රම හමුදාව හා වැඩ කළ හැකි වයසේ පසුවන ජනගහනය.

iii. වැටුප වෙනස්වීම නිසා ඇතිවන නිමවුම් ප්‍රතිවිපාකය හා ආදේශන ප්‍රතිවිපාකය.

iv. සේවා නියුක්ත අනුපාතය හා සේවා වියුක්ත අනුපාතය.

(මුළු ලකුණු 4 * 5 = 20)

* * * * * *